# 6. මිල සහ වැටුප්

## 6.1 මිල

මුදල් සැපයුම සෙමින් වර්ධනය වීමත්, ආනයනික උද්ධමනය පහත වැටීමත් සහ ආනයනය කරන ලද පාරිභෝගික භාණ්ඩ වඩාත් සුලභවීම නිසා 1998 දී උද්ධමනය අඩුවීම නොකඩවා සිදුවිය. මූල්‍ය ප්‍රසාරණ වේගය පහත වැටීමත් සමග මූර්ත පොළී අනුපාත ඉහළ ධන අගයක පැවැතීම මිල මත වූ ඉල්ලුම් පීඩනය අඩු කිරීමට හේතු විය. මේ අතරතුර, 1998 දී රුපියල විශාල වශයෙන් අවප්‍රමාණය වුවද, තිරිඟු, බොර තෙල්, පොහොර සහ සීනි වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රාශියක ආනයන මිල තියුණු ලෙස පහත වැටීම මෙම භාණ්ඩයන්හි දේශීය මිල ඉහළයාම නවතනු ලැබුණි. විශේෂයෙන් වසරේ දෙවන භාගය තුළ මිල වැඩිවීම අවම වූ අතර, පාරිභෝගික මිල උද්ධමනය 1998 අගෝස්තු මාසයේ සිට සියයට 6 ට වඩා අඩු අගයක පැවතුනි. වසරෙහි දෙවන භාගයේදී මිල වැඩිවීමේ වේගයෙහි අඩුවීමක් දක්නට ලැබුණද, ආහාර මිල ගණන් නොකඩවා ඉහළ මට්ටමක පැවැතුණි. 1998 දී සමස්ත පාරිභෝගික මිල ගණන් සියයට 7-9.5 කින් වැඩි වූ අතර, ආහාරවල සාමාන්‍ය මිල ගණන් සියයට 8-10 කින් වැඩි විය. පාරිභෝගික මිල වැඩිවීමට ආහාර ද්‍රව්‍ය මිල ඉහළයාමේ දායකත්වය සියයට 80 ක් පමණ විය. යල සහ මාස් කන්න දෙකෙහිම සතුටුදායක වී අස්වනු ඇතුළුව දේශීය සැපයුම් වර්ධනයවීම මෙන්ම ආනයනික ආහාර ද්‍රව්‍ය වඩාත් සුලභවීමද හේතුවෙන් වසර අගදී ආහාර මිල ඉහළයාමේ වේගය සියයට 2-4 අතර ප්‍රමාණයකින් පහත වැටී තිබුණි. 1997 සැප්තැම්බර් මාසයේදී සිදුකළ විදුලිය ගාස්තු වැඩි කිරීමේ සෘජු සහ වක්‍ර බලපෑම 1998 දී දක්නට විය. රෙදිපිළි, පාවහන්, විදුලි සංදේශ සහ සෞඛ්‍ය සේවා යන අංශයන්හි ක්‍රියාකාරිත්වය වර්ධනය වීම නිසා ඊට අදළ මිල වැඩිවීම් සැලකියයුතු ලෙස පහත වැටී තිබේ. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ භාණ්ඩ පැසට ඇතුලත් භාණ්ඩ වලින් සියයට 80 ක් පමණ භාණ්ඩ හා සේවා බද්දෙන් (භා.සේ.බ.) නිදහස් වුවද මෙම බද්ද හඳුන්වාදීම පාරිභෝගික මිල ගණන් සියයට 2-3 කින් වැඩි වීමට හේතු විය.

පවතින සියළු මිල දර්ශකවලින් 1998 වසරෙහිදී උද්ධමනයේ අඩුවීමක් පිළිබිඹු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගණනය කරනු ලබන කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය (කො.දි.පා.මි.ද.)1998 දී සියයට 7.3 ක සාමාන්‍ය වාර්ෂික වැඩිවීමක් පෙන්වන අතර, එය 1997 අදළ අගය වන සියයට 7.4 ට වඩා සුළු අඩුවීමකි. රජයේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ජීවන වියදම මැනීමේ නිල දර්ශකය වශයෙන් භාවිතා කරන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) සියයට 9.4 ක වාර්ෂික සාමාන්‍ය වැඩිවීමක් දැක්වූ අතර, එයද 1997 දී මෙම දර්ශකයෙන් පෙන්නුම් කළ සියයට 9.6 ක වැඩිවීමට වඩා සුළු අඩුවීමකි. ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින්ම ගණනය කරන විකල්ප දර්ශකයක් වන මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.), 1998 දී සියයට 6.9 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර, 1997 දී එම දර්ශකය වාර්තා කළ සියයට 7.1 වැඩිවීමට වඩා සුළු වශයෙන් පහළ යාමකි. මේ අතර, ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේ, තොග අලෙවි මිල දර්ශකයේ (තො.අ.මි.ද.) 1997 සියයට 6.9 ක වැඩිවීම සමග සසඳන විට 1998 දී වැඩිවීම සියයට 6.1 කි.

මහ අස්වැන්න කාලයට සමගාමීව පෙබරවාරි-මාර්තු සහ යල අස්වනු කාලයට සමගාමීව ජූලි-සැප්තැම්බර් කාලපරිච්ඡේද තුළදී සියළුම පාරිභෝගික මිල දර්ශකවලට අනුව මිල මට්ටම පහළ බසිමින්, 1998 වසර තුළ මිල හැසිරීම සාමාන්‍ය කාලීන රටාව පෙන්නුම් කළේය. 1997 ප්‍රථම භාගය සමග සසඳන විට 1998 ප්‍රථම භාගයේදී උද්ධමන වේගයේ සුළු වැඩිවීමක් සියළුම දර්ශකවලින් පෙන්නුම් කිරීම වැදගත්ය. 1998 ජූනි මාසයේ කො.පා.මි.ද.යේ ලක්ෂ්‍යමය පදනම (1997 ජූනි සහ 1998 ජූනි මාසයන්හි දර්ශක අංක සසඳමින් මනිනු ලබන) මත උද්ධමනය වැඩිවීමේ වේගය සියයට 14.1 ක් වූ අතර, කො.දි.පා.මි.ද. සහ ම.කො.පා.මි.ද. වල එම අනුරූපී වැඩිවීම් පිළිවෙලින් සියයට 9.5 සහ සියයට 10.1 ක් විය. කෙසේ වුවද, වර්ෂයේ දෙවන භාගයේදී උද්ධමනකාරී තත්ත්වය වඩා සතුටුදායක අතට හැරීමත් සමග, 1998 වසර අවසානයේදී සමස්ත උද්ධමන වේගය 1997 වසරෙහි පැවති අගයට වඩා සුළු වශයෙන් අඩු විය. දෙසැම්බර් මාසය වනවිට, කො.පා.මි.ද.

**6.1 සංඛ්‍යා සටහන**

**වාර්ෂික සාමාන්‍ය මිල වෙනස්වීම (%)**

| වර්ෂය | කො.පා.මි.ද. | ම.කො.පා.මි.ද. | කො.දි.පා.මි.ද. | තො.අ.මි.ද. | ද.ජා.නි.ග.මි.ද. |
|---|---|---|---|---|---|
| 1980 | 26.1 | - | - | 33.7 | 18.2 |
| 1981 | 18.0 | - | - | 17.0 | 20.6 |
| 1982 | 10.8 | - | - | 5.5 | 10.2 |
| 1983 | 14.0 | - | - | 25.0 | 14.7 |
| 1984 | 16.6 | - | - | 25.6 | 17.4 |
| 1985 | 1.5 | - | - | -15.2 | 0.8 |
| 1986 | 8.0 | - | - | -2.9 | 5.5 |
| 1987 | 7.7 | - | - | 13.4 | 6.8 |
| 1988 | 14.0 | - | - | 17.8 | 11.5 |
| 1989 | 11.6 | - | - | 9.0 | 9.7 |
| 1990 | 21.5 | 24.6 | - | 22.2 | 20.0 |
| 1991 | 12.2 | 11.5 | - | 9.2 | 11.2 |
| 1992 | 11.4 | 9.4 | - | 8.8 | 10.0 |
| 1993 | 11.7 | 8.4 | - | 7.6 | 9.5 |
| 1994 | 8.4 | 4.8 | - | 5.0 | 9.4 |
| 1995 | 7.7 | 3.9 | - | 8.8 | 8.4 |
| 1996 | 15.9 | 14.7 | - | 20.5 | 12.2 |
| 1997 | 9.6 | 7.1 | 7.4 | 6.9 | 8.7 |
| 1998 | 9.4 | 6.9 | 7.3 | 6.1(අ) | 8.4(අ) |

මූලයන් : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තාවකාලික


යේ ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය (1997 දෙසැම්බර් මස මත 1998 දෙසැම්බර්) සියයට 3.7 ට පහත වැටුන අතර, කො.දි.පා.මි.ද. සහ ම.කො.පා.මි.ද. එම අනුරූපී අගයන් පිළිවෙලින් සියයට 4.0 සහ සියයට 3.5 දක්වා අඩුවිය. ඉල්ලුම පැත්තෙන් අවපාතයට ලක් වූ ලෝක වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූර්ත ආදායම් වර්ධනය පහත වැටීම, 1997 සියයට 14.9 වර්ධනය සමග සසඳන විට මුදල් සැපයුමෙහි වර්ධනය 1998 දී සියයට 13 ක් පමණ වීම, මූර්ත පොලී අනුපාත ඉහළ ධන අගයක පැවැතිම යන සියලුම කරුණු මිල මත වූ ඉල්ලුම් පීඩනය අඩු කිරීමට දායක විය.

ශ්‍රී ලංකාව උද්ධමනය නොකඩවා අඩු මට්ටමක පවත්වා ගැනීමට තවමත් සමත් වී නැත. කො.පා.මි.ද. අනුව පාරිභෝගික මිල උද්ධමනයේ සාමාන්‍යය 1989-93 වසර පහ තුළ වූ සියයට 13.5 සිට පසුගිය වසර පහ තුළ සියයට 10.2 දක්වා පහත බැස තිබුනත්, රට උද්ධමනකාරී අගති තත්ත්වයෙන් මිදීම සඳහා සියයට 5 ට අඩු ස්ථායී උද්ධමන වේගයක් ලබා ගැනීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ උද්ධමන වේගය සිය වෙළෙඳ සහායකයින්ගේ සහ තරහ-කරුවන්ගේ වාර්ෂික සාමාන්‍ය උද්ධමන වේගයට වඩා ඉහළ මට්ටමක පැවැතී ඇත. මෙම තත්ත්වය ශ්‍රී ලංකාව ලෝක භාණ්ඩ වෙළෙඳපොළේ සිය තරහකාරිත්වය පවත්වා ගැනීම සඳහා විනිමය අනුපාතිකය වර්ෂයකට සියයට 5-6 පමණ වේගයකින් අවප්‍රමාණය කිරීමට බලපෑම් කර තිබේ. ආනයන අපනයන දෙකෙහිම එකතුව ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස සියයට 70 ක් පමණ වන ශ්‍රී ලංකාව, ඉහළ වෙළෙඳ රැඳියාවක් ඇති ආර්ථිකයක් වේ. එනිසා 1997 වාර්ෂික වාර්තාවෙහි ද සඳහන් කළ පරිදි විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම උද්ධමනය මත ප්‍රතිබලපෑමක් දක්වයි. ශ්‍රම ඵලදායීතාවයට වඩා උද්ධමනය සමග සෘජුව හෝ වක්‍රව බැඳුණු බොහෝ වැටුප්වල අභ්‍යන්තර වැටුප් නිර්ණය කිරීමෙහි ක්‍රියාපටිපාටිය, මෙම උද්ධමනය - වැටුප් - විනිමය අනුපාතිකය යන සම්බන්ධය ඇති කිරීමට තවත් මඟකි. මේ සමඟ, නොකඩවා පවතින අධික අයවැය හිඟය, මහජනයා තුළ පවතින උද්ධමන අපේක්ෂතාව තුරන් කිරීම අභියෝගාත්මක කටයුත්තක් බවට පත්ව තිබේ. එබැවින් අයවැය හිඟය සියයට 5 ට අඩුවෙන් පවත්වා ගනිමින් සහ ඵලදායීතාව මත පදනම් වූ වැටුප් නිර්ණය කිරීමෙහි ක්‍රියාපටිපාටියක් හඳුන්වා දෙමින් උද්ධමනය අඩු අගයක පවත්වා ගැනීමට කටයුතු යෙදිය යුතු වේ. මෙයට අමතරව ශ්‍රම වෙළෙඳපොළෙහි ව්‍යුහාත්මක දුර්වලතාවයන් තුරන් කිරීමට වෙනත් ක්‍රියාමාර්ග යෙදවිය යුතුය. මෙම ක්‍රියාමාර්ග තරහකාරී වාතාවරණයක් යටතේ සේව්‍ය සේවක දෙපිරිසටම සම රැකවරණයක් සපයන අතරම ශ්‍රම වෙළෙඳපොළ වඩාත් නම්‍යශීලී බවටද පත් කරනු ඇත.

## කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය

1998 දී ශ්‍රී ලංකා මහ බැංකුව විකල්ප මිල දර්ශකයක් වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම අවසන් කෙරිණ. මෙම දර්ශකය 1996/97

6.1 රූප සටහන
**කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය**
**(ඔක්. 1996 - සැප්. 1997 - 100)**




පාරිභෝගික මූල්‍ය සහ සමාජ ආර්ථික සමීක්ෂණයේ මාස 12 ක දත්ත මත පදනම් විය. සමීක්ෂණයෙන් ආවරණය වූ කොළඹ දිස්ත්‍රික්කයේ කුටුම්භයන්ගේ පහළම සියයට 40 ක, (ආදායම් මට්ටම අනුව පෙළ ගැස්වීමෙන්) පරිභෝජන රටාව ප්‍රයෝජනයට ගනිමින් දර්ශකය සඳහා වූ භාණ්ඩ පැස තෝරා ගැනිණ. දර්ශකය සඳහා බර තැබීමේදී කල් නොපවත්නා සියළුම භාණ්ඩ හා සේවා සැලකිල්ලට ගනු ලැබිණ. මෙම භාණ්ඩ හා සේවා උප කාණ්ඩයන් 9 කට වර්ගීකරණය කරන ලද අතර එම උප කාණ්ඩ සඳහා උප දර්ශකයන් ගණනය කරනු ලැබිණ. ඒවා නම් ආහාර; රෙදිපිළි; ඉන්ධන හා ආලෝකය; ගෙවල් කුලී; මත්පැන්; දුම්කොළ; බුලත් සහ පුවක්; සනීපාරක්ෂාව සහ සෞඛ්‍ය; ප්‍රවාහනය; අධ්‍යාපනය සහ විවේක කටයුතු සහ විවිධ යන කාණ්ඩයන් ය. කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයට අනුව ආහාර, ඉන්ධන සහ ආලෝකය සහ විවිධ උප කාණ්ඩවල හැර අන් සියලු කාණ්ඩයන්හි මිල වැඩිවීමේ වේගය අඩු විය.

වර්ෂය තුළ ආහාර මිල සියයට 8.9 කින් ඉහළ ගිය අතර 1998 කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයේ සමස්ත වැඩිවීමට ඉන් සිදු වූ දායකත්වය සියයට 71.5 ක් විය. 1997 දී ආහාර කාණ්ඩයේ ඉහළයාම සියයට 7.3 ක පහළ මට්ටමක විය. 1997 අගෝස්තු මාසයේදී ඉහල නංවනු ලැබූ තිරිඟු පිටි මිල 1998 වසර පුරාම නොවෙනස්ව පැවතිණි. පෙර වසර හා සසඳන විට වී නිෂ්පාදනය සියයට 20 කින් ඉහළයාම නිසා ප්‍රධාන ආහාරය වන සහල් මිල ස්වල්ප වශයෙන් වැඩි වූ අතර සමහර සහල් වර්ගවල මිල පහත වැටුණි. කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයේ ඉහළ යාමට සහල් මිල වැඩිවීමේ දායකත්වය සියයට 1 ක් වූ අතර, පාන් සහ තිරිඟු පිටිවල දායකත්වය සියයට 5 ට වඩා අඩු විය. මෙයට වෙනස් තත්වයක් පෙන්වමින් වසරේ මුල් භාගය තුළ බොහෝ වර්ගවල එළවළු මිල ගණන් තියුණු ලෙස ඉහළ ගියේය. 1997 අවසන් මාස දෙකෙහි පැවති අධික වර්ෂාව, මාර්තු/අප්‍රේල් කාලයේ පැවති උණුසුම් දේශගුණික තත්ත්වය සහ සුපුරුදු කලට පෙර නුවරඑළිය

**6.2 සංඛ්‍යා සටහන**

**කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය ( 1996 ඔක්.-1997 සැප්. = 100)**

| ශීර්ෂ | හරිත | දර්ශකයේ සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | 1998 වැඩිවීමේ දායකත්වය(%) |
|---|---|---|---|---|---|---|---|---|
| | | 1997 | 1998 | 1997 | 1998 | දෙසැ./1997 | දෙසැ./1998 | |
| සියළුම ශීර්ෂ | 100.0 | 102.0 | 109.5 | 7.4 | 7.3 | 8.3 | 4.0 | 100.0 |
| භාණ්ඩ අනුව | | | | | | | | |
| ආහාරපාන | 58.7 | 102.0 | 111.1 | 7.3 | 8.9 | 8.3 | 3.8 | 71.5 |
| ගෙවල්කුලී | 13.2 | 101.7 | 105.0 | 4.4 | 3.3 | 6.7 | 1.1 | 5.9 |
| ඉන්ධන හා ආලෝකය | 4.9 | 104.3 | 118.7 | 8.9 | 13.8 | 16.8 | 2.5 | 9.5 |
| රෙදිපිළි හා පාවහන් | 6.2 | 101.8 | 104.2 | 10.1 | 2.4 | 6.7 | 2.5 | 2.0 |
| මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක් | 4.4 | 103.2 | 111.0 | 14.1 | 7.6 | 11.8 | 19.8 | 4.7 |
| සනීපාරක්ෂක සහ සෞඛ්‍ය සේවා, | 3.8 | 103.1 | 109.1 | 14.4 | 5.8 | 12.6 | 6.6 | 3.1 |
| අධ්‍යාපන හා විනෝදය | 2.8 | 101.1 | 102.3 | 4.6 | 1.2 | 4.5 | 2.4 | 0.4 |
| ප්‍රවාහන | 3.7 | 100.1 | 100.3 | 1.4 | 0.2 | 0.5 | 0.5 | 0.1 |
| විවිධ | 2.2 | 101.7 | 111.3 | 7.0 | 9.5 | 5.1 | 13.9 | 2.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රදේශයේ පැවති අධික සුළං සහිත තත්ත්වය එළවළු නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වුවද, වසරේ දෙවන භාගය වනවිට සැපයුම් තත්ත්වය වර්ධනය වීම නිසා එළවළු මිල ගණන් පහළ ගියේය. වසර තුළ කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයේ සමස්ත වැඩිවීමෙන් සියයට 13 කට එළවළු මිල දායක වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

ප්‍රධාන අතිරේක ආහාර භෝග අතුරින් වියළි මිරිස් හා රතුළූණු මිල ඉහළ යාම සියයට 30 ඉක්ම වූ අතර ලොකු ළූණු මිල වැඩිවීම සියයට 70 ඉක්ම විය. අර්තාපල් මිලද තියුණු ලෙස ඉහළ ගියේය. පසුගිය වසරේ තියුණු ලෙස මිල පහළ යාම නිසා දේශීය නිෂ්පාදනය පහළ වැටීමත්, සැපයුම් රටවල නිෂ්පාදන මට්ටම පහළ වැටීම නිසා සාපේක්ෂව ආනයන මිල ඉහළ යාමත් අතිරේක ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමට බලපා ඇත. වියළි මිරිස්, ළූණු සහ අර්තාපල් වැනි ප්‍රධාන අතිරේක භෝග කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකයේ සමස්ත වැඩිවීමට සියයට 19 කින් දායක වී ඇත. දේශීය නිෂ්පාදනය තවදුරටත් පහළ යාමේ හේතුවෙන් වසර තුළදී පොල් මිල ගණන් සියයට 12 කින් ඉහළ ගියේය. මෙම මිල ගණන්හි ඉහළයාම, ලෝක වෙළෙඳපොළේ පැවති පහත් මිල ගණන් හේතුවෙන් සීනි මිල අඩුවීම මගින් සුළු වශයෙන් සමනය විය.

ඉකුත් වසරේ වූ සියයට 8.9 ක වැඩිවීම හා සසඳන විට 1998 දී ඉන්ධන හා ආලෝකය කාණ්ඩයෙහි මිල ගණන් සියයට 13.8 කින් වැඩි විය. 1997 සැප්තැම්බර් මාසයේ විදුලිබල ගාස්තු වැඩිකිරීම මෙම වසර තුළ ඉන්ධන සහ ආලෝකය කාණ්ඩයේ මිල ගණන් වැඩිවීමට ප්‍රධාන හේතුව විය. මෙම කාණ්ඩයේ මිල වැඩිවීම සමස්ත දර්ශකයෙහි ඉහළයාමට සියයට 9.5 කින් දායක වී ඇතැයි පෙනෙන්නට තිබේ.

නිවාස; රෙදිපිළි හා පාවහන්; මත්පැන්; දුම්කොළ, බුලත් සහ පුවක් ; සනීපාරක්ෂාව හා සෞඛ්‍ය; අධ්‍යාපනය හා විනෝද කටයුතු සහ ප්‍රවාහන යන කාණ්ඩයන්හි මිල ඉහළයාම පිළිවෙලින් සියයට 3.3, සියයට 2.4, සියයට 7.6, සියයට 5.8, සියයට 1.2 සහ සියයට 0.2 වූ අතර එය පෙර වසරේ මිල ගණන් ඉහළයාම් වූ පිළිවෙලින් සියයට 4.4, සියයට 10.1, සියයට 14.1, සියයට 14.4, සියයට 4.6, හා සියයට 1.4 ට වඩා අඩු ඉහළ යාමකි. 1998 අයවැයෙන් රෙදිපිළි අංශය නිදහස් කිරීම, රෙදිපිළි හා පාවහන් කාණ්ඩයේ මිල පහළ යාමට හේතු විය. විවිධ කාණ්ඩයේ මිල ගණන් පෙර වසරේ ඉහළයාම වූ සියයට 7.0 හා සසඳන විට 1998 දී සියයට 9.6 කින් වර්ධනය විය.

## කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

1998 දී කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) සියයට 9.4 වාර්ෂික වැඩිවීමක් දක්නට ලැබුණි. 1998 දෙසැම්බර් මස ලක්ෂ්‍යමය උද්ධමනය වැඩිවීම සියයට 3.7 වූ අතර පසුගිය වසරෙහි එය සියයට 10.7 ක විශාල වැඩිවීමක් දැක්විණි. කොළඹ දිස්ත්‍රික්කයේ පාරිභෝගික මිල දර්ශකය හා මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට වඩා වැඩි උද්ධමන වේගයක් කො.පා.මි. දර්ශකයෙන් පෙන්නුම් කරයි. කො.දි.පා.මි.ද. සහ ම.කො.පා.මි.ද. සමග සසඳන විට මෙම දර්ශකය කෙරෙහි සමස්ත ආහාර කාණ්ඩයේ මෙන්ම එළවළු වැනි ආහාර ද්‍රව්‍යවල බලපෑම (1998 දී තියුණු ලෙස වැඩිවීමක් පෙන්නුම් කළ) වැඩිවීම මෙයට හේතු විය හැකිය.

දර්ශකයේ සමස්ත වැඩිවීම කෙරෙහි සියයට 84 කින් ආහාර මිල ගණන් දායක වූ අතර, වර්ෂය තුළ ආහාර මිල ගණන්වල වැඩිවීම 10.9 විය. කො.පා.මි.දර්ශකයේ ආහාර

කාණ්ඩයේ මිල ගණන්වල මෙම වැඩිවීම පසුගිය වසරේ එම මිල ගණන් වැඩිවීම හා සමානය. වසර තුළ ආහාර මිල ගණන් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එළවළු, පොල්, වියළි මිරිස්, රතුළූණු හා අර්තාපල් වැනි අතිරේක ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අධික වීමය.

## මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය


1997 වසරේ ම.කො.පා.මි. දර්ශකයේ ආහාර මිල ගණන්වල සියයට 7.5 ක වැඩිවීම සමග සසඳන විට 1998 වසරේ වැඩිවීම සියයට 7.7 කි. 1997 සියයට 5.2 ක් වූ

**6.3 සංඛ්‍යා සටහන**
**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (1952 = 100)**

| ශීර්ෂ | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | 1998 වැඩිවීමේ දායකත්වය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | භරිත | 1997 | 1998 | 1997 | 1998 | දෙසැ./1997 | දෙසැ./1998 | |
| සියළුම ශීර්ෂ | 100.0 | 2089.1 | 2284.9 | 9.6 | 9.4 | 10.7 | 3.7 | 100.0 |
| කාණ්ඩ අනුව | | | | | | | | |
| ආහාර | 61.9 | 2336.9 | 2592.1 | 10.9 | 10.9 | 13.3 | 2.3 | 84.0 |
| රෙදිපිළි | 9.4 | 844.0 | 852.3 | 2.7 | 1.0 | 1.4 | 1.6 | 0.4 |
| ඉන්ධන හා ආලෝකය | 4.3 | 3752.8 | 3872.8 | 4.5 | 3.2 | 4.7 | 0.2 | 2.6 |
| ගෙවල් කුලී | 5.7 | 109.8 | 109.8 | - | - | - | - | - |
| විවිධ | 18.7 | 2157.8 | 2319.9 | 8.2 | 7.5 | 4.7 | 12.7 | 13.0 |

මූලය: ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව


**6.2 රූප සටහන**
**කොළඹ පාරිභෝගිකයන් ගේ මිල දර්ශකය**
**(1952 - 100)**




රෙදිපිළි; ඉන්ධන හා ආලෝකය සහ විවිධ කාණ්ඩවල මිල ගණන්වල වැඩිවීම පිළිවෙලින් සියයට 1.0, සියයට 3.2 සහ සියයට 7.5 වූ අතර, පසුගිය වසරෙහි එම කාණ්ඩවල මිල පිළිවෙලින් සියයට 2.7, සියයට 4.5 සහ සියයට 8.2 කින් තියුණු ලෙස වැඩිවිය. 1998 වසරේ කො.පා.මි.ද. ඉහළ යාමට ඉන්ධන හා ආලෝකය සහ විවිධ කාණ්ඩ ඉහළයාමේ දායකත්වයන් පිළිවෙලින් සියයට 3 ක් සහ සියයට 13 ක් විය.

ඉන්ධන හා ආලෝකය කාණ්ඩයේ මිල ගණන් වැඩිවීම සමඟ සසඳන විට 1998 දී සියයට 6.4 කින් වැඩි විය. රෙදිපිළි ආනයනය ලිහිල්කරණය කිරීමේ බලපෑම පෙන්නුම් කරමින් 1998 දී රෙදිපිළි කාණ්ඩය සියයට 1.9 කින් අඩු වූ අතර, එය 1997 දී සියයට 4.0 කින් වැඩි විය. 1998 දී මත්පැන්, බුලත් සහ පුවක්, සනීපාරක්ෂාව, සෞඛ්‍යය, ගෘහස්ථ භාණ්ඩ හා සේවා, ප්‍රවාහන හා පණිවුඩ හුවමාරු සහ විවිධ කාණ්ඩයන්ගේ මිල ගණන් වැඩිවීමේ වේගය අඩු වී ඇත.

**6.3 රූප සටහන**
**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(ජන.-ජූනි 1989 - 100)**



**6.4 සංඛ්‍යා සටහන**
**මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය**
**(1989 ජනවාරි සිට ජූනි = 100)**

| ශීර්ෂ | භරිත | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1997 | 1998 | 1997 | 1998 | දෙසැ.1997 | දෙසැ.1998 |
| සියළුම ශීර්ෂ | 100 | 220.1 | 235.2 | 7.1 | 6.9 | 7.9 | 3.5 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර පාන, | 69.3 | 232.2 | 250.1 | 7.5 | 7.7 | 8.9 | 2.4 |
| මත්පැන්,දුම්කොළ,බුලත් සහ පුවක් | 3.8 | 273.4 | 295.8 | 9.0 | 8.2 | 4.2 | 21.4 |
| ගෙවල්කුලී | 8.9 | 109.9 | 110.0 | 0.1 | 0.1 | 0.2 | - |
| ඉන්ධන හා එළිය | 5.4 | 227.1 | 241.6 | 5.2 | 6.4 | 9.2 | 0.6 |
| රෙදිපිළි හා පාවහන් | 2.8 | 227.1 | 231.4 | 4.0 | 1.9 | 2.7 | 6.8 |
| සනීපාරක්ෂක හා සෞඛ්‍ය සේවා, ගෘහස්ත භාණ්ඩ හා සේවා | 4.9 | 227.0 | 242.7 | 11.9 | 6.9 | 10.9 | 5.9 |
| ප්‍රවාහන හා පණිවිඩ හුවමාරු | 2.8 | 195.0 | 196.0 | 7.3 | 0.5 | 0.4 | 0.8 |
| විවිධ | 2.1 | 179.2 | 183.5 | 3.1 | 2.4 | 1.5 | 11.3 |


මූලය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

## තොග අලෙවි මිල දර්ශකය

1997 වර්ෂයේදී තොග අලෙවි මිල දර්ශකයේ වාර්ෂික සාමාන්‍ය වැඩිවීම සියයට 6.9 ක් වූ අතර 1998 දී එය සියයට 6.1 දක්වා පහත වැටුණි. වී මිල පහත වැටීම, තිරිඟු ඇට සහ සහල්වල ආනයනික මිල අඩුවීම, සාපේක්ෂව අඩු වේගයකින් තේ මිල ඉහළ නැගීම, රබර් මිල පහත වැටීම සහ ඛනිජ තෙල් නිෂ්පාදන මිල නොවෙනස්ව පැවතීම, ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේ මිල පහත වැටීමට දායක වූ සාධක කිහිපයකි. මත්පැන්, රෙදිපිළි හා පාවහන්, රසායන හා රසායනික නිෂ්පාදන, ලෝහ නිෂ්පාදන හා ඉන්ධන සහ ආලෝකය යන කාණ්ඩයන් හි මිල ගණන් ද 1998 වර්ෂයේදී පෙන්නුම් කළේ සුළු වැඩිවීමකි.

පසුගිය වසරේ ආහාර කාණ්ඩයේ මිල ඉහළයාම වූ සියයට 8.8 සමග සසඳන විට, 1998 දී එය සියයට 8.0 ක සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. වසරේ වී නිෂ්පාදනය වැඩිවීම හේතුවෙන් විවෘත වෙළෙඳපොළේ වී නිෂ්පාදන මිල සියයට 6 කින් පමණ පහළ වැටුණි. ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල අඩුවීම නිසා සහල් සහ තිරිඟු ඇට ආනයනය කිරීමේ මිල, රක්ෂණය සහ ගැල් කුලී (මි.ර.ගැ.) ගාස්තු ද අඩු විය. මේ අතර පසුගිය වසරෙහිදී පිළිවෙලින් සියයට 20 හා සියයට 13 කින් වැඩි වූ මැදිබිම් හා පහත් බිම් තේ මිල ගණන් මෙම වසරෙහිදී පිළිවෙලින් සියයට 13 හා සියයට 10 ක අඩු මිල වැඩිවීමක් වාර්තාගත කර ඇත. මෙම කරුණු තොග වෙළෙඳ මිල දර්ශකයෙහි ආහාර මිල ගණන් වැඩිවීමේ වේගය අඩුවීමට දායක වූ ප්‍රධාන සාධක ලෙස දැක්විය හැකිය. කෙසේ වුවද, සිල්ලර මිල හැසිරීම මෙන්ම, ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමේදී අතිරේක ආහාර භෝග සහ එළවළු මිල ගණන් වැඩිවීමද වේගවත් විය.

**6.4 රූප සටහන**
**තොග අලෙවි මිල දර්ශකය**
**(1974 - 100)**




මත්පැන්, රෙදිපිළි හා පාවහන්, රසායන හා රසායනික නිෂ්පාදන, ලෝහ නිෂ්පාදන හා ඉන්ධන සහ ආලෝකය කාණ්ඩයන්හි මිල ගණන් 1998 වසරේදී සුළු වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද, 1997 වසරේදී මිල පහත වැටීමක් පෙන්නුම් කළ කඩදාසි නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ විවිධ යන කාණ්ඩයන් 1998 වසරේදී මිල ඉහළ යාමක් වාර්තා කළේය.

ආංශික වර්ගීකරණය අනුව, දේශීය සහ ආනයන කාණ්ඩවල මිල ගණන් 1998 දී මන්දගාමීව වැඩි විය. අපනයන කාණ්ඩයේ මිල ගණන් 1998 දී සීඝ්‍රයෙන් වැඩි විය. මෙම සීඝ්‍ර වර්ධනයට හේතු වූ ප්‍රධාන සාධකය පොල් අපනයන මිල ඉහළ යාමය.

අවසන් උපයෝගීතාව අනුව වර්ග කිරීමේදී, 1998 දී පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ කාණ්ඩයන්හි මිල ගණන් වැඩිවීමේ වේගය පහත වැටුණු අතර ආයෝජන කාණ්ඩයේ මිල ගණන් වේගයෙන් ඉහළ ගියේය.

කොළඹ, බිත්තර මිල ඉතාමත් අඩු විය. කොළඹ මිල ගණන් හා සසඳන විට 1998 දී මාතර වෙළෙඳපොළේ බිත්තර සඳහා ඉහළ මිල ගණන් පැවතීම මිල වෙනස්කම් අතර කැපී පෙනේ.

**6.5 සංඛ්‍යා සටහන**

**තොග අලෙවි මිල දර්ශකය (1974 = 100)**

| | | දර්ශකයේ වාර්ෂික සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| ශීර්ෂ | භරිත | 1997 | 1998(අ) | 1997 | 1998(අ) | දෙසැ.1997 | දෙසැ.1998(අ) |
| සියළුම ශීර්ෂ | 100.0 | 1224.3 | 1298.7 | 6.9 | 6.1 | 6.6 | 0.9 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර පාන, | 67.80 | 1132.2 | 1223.2 | 8.8 | 8.0 | 8.1 | 0.2 |
| මද්‍යපාන | 2.86 | 1361.3 | 1398.3 | 15.8 | 2.7 | - | 21.1 |
| රෙදිපිළි හා පාවහන් | 4.02 | 633.8 | 634.5 | 1.2 | 0.1 | - | 0.2 |
| කඩදාසි නිෂ්පාදන | 1.37 | 902.9 | 915.0 | -15.1 | 1.3 | -0.7 | 2.0 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 5.16 | 717.3 | 772.0 | 8.5 | 7.6 | 8.4 | 8.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 6.42 | 1528.2 | 1528.2 | 11.2 | - | - | - |
| ලෝහ නොවන නිෂ්පාදන | 1.78 | 2387.6 | 2655.8 | 6.6 | 11.2 | 24.1 | 6.5 |
| ලෝහ නිෂ්පාදන | 0.93 | 806.1 | 816.3 | 2.8 | 1.3 | 2.1 | 0.4 |
| ප්‍රවාහන උපකරණ | 0.80 | 937.3 | 933.9 | 3.2 | -0.4 | 1.2 | -4.6 |
| විදුලි උපකරණ හා සැපයුම් | 0.96 | 800.6 | 837.9 | 4.3 | 4.7 | 4.3 | 1.5 |
| යන්ත්‍රෝපකරණ | 1.33 | 596.1 | 651.3 | -1.4 | 9.3 | 1.3 | 11.6 |
| ඉන්ධන හා ආලෝකය | 1.79 | 2694.8 | 2824.7 | 11.8 | 4.8 | 17.1 | -11.1 |
| විවිධ | 4.78 | 2582.5 | 2587.5 | -5.4 | 0.2 | -2.7 | 0.4 |
| ආංශික වර්ගීකරණය 1 | 50.31 | 1059.1 | 1111.6 | 6.5 | 5.0 | 8.0 | 2.8 |
| දේශීය ගණය | 27.17 | 933.5 | 934.1 | 8.2 | 0.1 | 3.7 | 0.1 |
| ආනයන ගණය | 22.52 | 1944.5 | 2156.7 | 6.7 | 10.9 | 6.5 | -0.9 |
| අපනයන ගණය | | | | | | | |
| ආංශික වර්ගීකරණය 11 | 75.30 | 1190.4 | 1280.8 | 8.9 | 7.6 | 8.2 | 0.9 |
| පාරිභෝගික භාණ්ඩ | 20.52 | 1324.6 | 1328.7 | 1.2 | 0.3 | -1.0 | -0.4 |
| අන්තර් භාණ්ඩ | 4.18 | 1342.7 | 1473.5 | 5.6 | 9.7 | 18.7 | 6.5 |
| ආයෝජන භාණ්ඩ | | | | | | | |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව


## ප්‍රාදේශීය මිල වෙනස්වීම

පසුගිය වර්ෂවලදී මෙන්ම, සහල්, වියළි මිරිස් සහ අර්තාපල් වැනි ඉක්මනින් නරක් නොවන ද්‍රව්‍යවල ප්‍රාදේශීය මිල වෙනස්වීම සාපේක්ෂව අඩු වූ අතර, එළවළු සහ මාළු මිල ගණන්වල කැපී පෙනෙන වෙනස්කම් ඇති බව දැකිය හැකි විය. 1997 සමග සසඳන විට 1998 දී බිත්තර සහ පොල්වල ප්‍රාදේශීය මිල වෙනස්වීම පුළුල් වී ඇති බව පෙනුණි.

ප්‍රාදේශීය නිෂ්පාදන රටාවට අනුකූලව, අනුරාධපුරයේ සම්බා සහල් මිල අඩුම අගය ගත් අතර, කැකුළු සහල්වල අවම මිල මාතරින් වාර්තා විය. කොළඹ සහල් සඳහා ඉහළම මිල ගණන් පැවතුනි. කොළඹ මිල ගණන් හා සසඳන විට, ප්‍රාදේශීය මධ්‍යස්ථානවල එළවළු මිල ගණන් අඩු වූ අතර, අවම මිල වාර්තා වූයේ අනුරාධපුරයෙනි.

සමාලෝචනයට භාජනය කළ වෙළෙඳපොළ සතරෙහි කාලීන මිල රටාව තරමක්දුරට සමාන විය. කෙසේ වුවද, සහල් මිලෙහි කාලීන වෙනස්වීම් 1997 දීට වඩා අඩුවෙන් පෙන්නුම් කළේය. ජනවාරි මාසයේ සාපේක්ෂව ඉහළ මට්ටමක සිට මාර්තු-අප්‍රේල් මාසවල පහළ මට්ටමක් දක්වා අඩුවීමෙන් අනතුරුව ජුනි මාසයේදී උච්ච ස්ථානයට ළඟා වූ බෝංචි මිලෙහි කාලීන හැසිරීම 1997 දීට වඩා 1998 දී කැපී පෙනුණි. ජුනි මාසයෙන් පසුව මිල ගණන් අඩුවීම නිසා මෙම වසරේ දෙවන භාගයේදී සාපේක්ෂව අඩු මිල ගණන් පැවතුණි. බොහෝ එළවළු වර්ගවල මිල හැසිරීම මෙම රටාවට අනුකූල වූ බව පෙනී ගියේය. අවුරුද්ද මුළුල්ලෙහිම කොළඹ පැවති බෝංචි මිල ගණන් ප්‍රාදේශීය වෙළෙඳපොළවල පැවති මිල ගණන්වලට වඩා සැලකිය යුතු ලෙස වැඩි විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම රතුළූණු මිල පැහැදිලි කාලීන රටාවක් පෙන්වීය. කෙසේ වුවද, අඩු නිෂ්පාදන මට්ටමක් පැවැතීම නිසා, විශාල නිෂ්පාදනයක් පැවැති 1997 දී

### 6.5 රූප සටහන
### තෝරාගත් භාණ්ඩවල සිල්ලර මිලෙහි මාසික සාමාන්‍යයන් - 1998




### 6.6 සංඛ්‍යා සටහන
### තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක සිල්ලර මිල ගණන් (මුළු දිවයින)

| අයිතමය | ඒකකය | මිල රුපියල් වලින් | | ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| | | 1997 | 1998(අ) | 1998 |
| සහල් (තම්බන ලද) | කි.ග්‍රෑ. | 22.26 | 22.03 | -1.0 |
| පාන් (ග්‍රෑම් 450) | ගෙඩියක් | 7.57 | 8.25 | 9.0 |
| බිත්තර (සාමාන්‍ය) | එකක් | 4.46 | 4.21 | -5.6 |
| පොල් (මධ්‍යම) | ගෙඩියක් | 8.82 | 9.76 | 10.7 |
| එළවලු | | | | |
| කරවිල | කි.ග්‍රෑ. | 26.98 | 32.00 | 18.6 |
| ගෝවා | " | 24.64 | 31.90 | 29.5 |
| කැරට් | " | 34.90 | 43.42 | 24.4 |
| බෝංචි | " | 33.40 | 41.34 | 23.8 |
| ලීක්ස් | " | 31.72 | 39.39 | 24.2 |
| අර්තාපල් | " | 32.29 | 37.28 | 15.5 |
| රතුළූණු (මධ්‍යම) | " | 46.65 | 65.50 | 40.4 |
| වියළි මිරිස් (නො.1) | " | 98.86 | 125.78 | 27.2 |
| මුහුදු මාළු | | | | |
| කෙළවල්ලා | කි.ග්‍රෑ. | 149.16 | 150.49 | 0.9 |
| ගල්මාළු | " | 118.71 | 121.37 | 2.2 |
| හුරුල්ලා | " | 83.74 | 87.87 | 4.9 |
| සාලයා | " | 61.00 | 64.33 | 5.5 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

තරම් පහළ මට්ටමකට රතුළූණු මිල ගණන් අඩු නොවීය. වසරේ වැඩි කාලයක් තුළ මහනුවර වෙළෙඳපොළේ පැවති රතුළූණු මිල ගණන් කොළඹ වෙළෙඳපොළේ පැවති රතුළූණු මිල ගණන් ඉක්මවා යාම වැදගත් වේ. නිෂ්පාදනය පහත වැටීම සහ වසර මුළුල්ලෙහිම ආනයනය කළ අර්තාපල්, වෙළෙඳපොළෙහි පැවතීම හේතුවෙන් අර්තාපල් මිල ගණන් වලද පෙන්නුම් කළ කාලීන රටාව 1997 ට වඩා අඩු විය.

ප්‍රදේශයෙන් ප්‍රදේශයට මෙන්ම ප්‍රදේශ තුළ භාණ්ඩ මිල වෙනස්වීම පසුගිය වසර තුනට වඩා 1998 දී අඩු වී තිබේ. අලෙවි කරන ක්‍රියා පටිපාටියෙහි දුර්වලතා හේතුවෙන් විශාල වශයෙන් මිල වෙනස්වීම තම වාසියට හරවා ගන්නා වෙළෙඳුන් වෙළෙඳපොළට බලපෑම් කරන නිසා මෙම වෙනස්වීම් තවදුරටත් අඩු කිරීම පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන් යන දෙපිරිසටම ප්‍රයෝජනවත් වේ. වාණිජමය නිෂ්පාදනය හා වෙළෙඳ ක්‍රම දියුණු කිරීමට හැකිනම් පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් යන දෙපිරිසටම වාසිදයක වන පරිදි මෙම තත්ත්වය දියුණු කළහැකි වනු ඇත. මේ සඳහා පෞද්ගලික අංශයෙහි සහභාගිත්වය වැඩිකිරීමත් සමඟම ඇසුරුම්, හැසිරවීම් හා ගබඩාකරණ පහසුකම් ඇතුළුව ප්‍රාදේශීය වෙළෙඳම් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා එම සේවා ව්‍යාප්ත කිරීම දියුණු කළ යුතුය.

6.7 සංඛ්‍යා සටහන

**1998 වර්ෂය තුළ තෝරාගත් වෙළෙඳපොළ කිහිපයක තෝරාගත් ආහාර ද්‍රව්‍ය සඳහා පැවති සිල්ලර මිලෙහි වාර්ෂික සාමාන්‍යයන් (අ)**

| භාණ්ඩය | මිල (රු./කි.ග්‍රෑ.) | | | | කොළඹ හා සාපේක්ෂව ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|---|
| | කොළඹ | මහනුවර | මාතර | අනුරාධපුරය | මහනුවර | මාතර | අනුරාධපුරය |
| සම්බා සහල් | 29.96 | 29.71 | 28.95 | 27.22 | -0.8 | -3.4 | -9.1 |
| කැකුළු සහල් | 24.61 | 24.05 | 21.11 | 22.57 | -2.3 | -14.2 | -8.3 |
| බෝංචි | 53.71 | 44.61 | 41.59 | 39.89 | -16.9 | -22.6 | -25.7 |
| ගෝවා | 40.98 | 33.26 | 33.64 | 31.69 | -18.8 | -17.9 | -22.7 |
| වම්බටු | 35.13 | 24.72 | 21.50 | 20.15 | -29.6 | -38.8 | -42.6 |
| පිපිංඤ්ඤා | 24.51 | 23.44 | 19.38 | 17.11 | -4.4 | -20.9 | -30.2 |
| රතුළූණු | 66.16 | 73.55 | 66.08 | 61.11 | 11.2 | -0.1 | -7.6 |
| ලොකු ළූණු | 42.22 | 42.33 | 41.88 | 42.03 | 0.3 | -0.8 | -0.5 |
| අර්තාපල් | 32.72 | 33.12 | 32.20 | 32.20 | 1.2 | -1.6 | -1.6 |
| වියළි මිරිස් | 130.00 | 136.38 | 130.75 | 129.33 | 4.9 | 0.6 | -0.5 |
| කෙළවල්ලා | 138.85 | 165.17 | 158.00 | 165.28 | 19.0 | 13.8 | 19.0 |
| හුරුල්ලා | 80.48 | 98.56 | 71.06 | 94.33 | 22.5 | -11.7 | 17.2 |
| බිත්තර (1 ක මිල රු.) | 3.42 | 3.63 | 4.03 | 3.62 | 6.1 | 17.8 | 5.8 |
| පොල් (ගෙඩියක මිල රු.) | 13.40 | 11.22 | 13.07 | 10.50 | -16.3 | -2.5 | -21.6 |

(අ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## 6.2 වැටුප්

1998 දී රාජ්‍ය අංශයේ මූල්‍ය සහ මූර්ත වැටුප් දෙකම වර්ධනය විය. මෙය රාජ්‍ය අංශයේ සියළුම සේවා නියුක්තිකයන්ට බී.සී.පෙරේරා වැටුප් සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරන ලද මූල්‍ය වැටුප් වැඩිවීමේ දෙවන අදියර ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයකි. සංවිධිත පෞද්ගලික අංශයේ, පඩිපාලක සහා විශාල සංඛ්‍යාවක අවම වැටුප් වැඩි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, කාණ්ඩ රැසකට අයත් සේවකයන්ගේ වැටුප්වල සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. සංවිධිත පෞද්ගලික අංශයේ සමස්ත වැටුප් වැඩිවීම 1997 ට වඩා තියුණු විය. කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ වාණිජ කටයුතුවල නියැලුන කම්කරුවන්ගේ මූර්ත වැටුප් වර්ධනය විය. අසංවිධිත අංශයේ, ප්‍රධාන ක්‍රියාකාරකම් රාශියක මූල්‍ය වැටුප් වැඩි විය. වී, තේ සහ පොල් වගාවන්හි ප්‍රධාන ක්‍රියාකාරකම්වල මූර්ත වැටුප් සැලකියයුතු ලෙස වර්ධනය වී ඇත. ගොඩනැගිලි කර්මාන්තයේ ක්‍රියාකාරකම් මෙන්ම රබර් වගාවේ ප්‍රධාන කාර්යයන්වල මූර්ත වැටුප් අඩුවීමක් දැකිය හැකිවිය.

### රාජ්‍ය අංශය

රාජ්‍ය අංශයේ, වැටුප් සමාලෝචන කමිටුවෙන් යෝජිත වැටුප් පරිමාණ ප්‍රතිව්‍යුහගත කිරීම අදියර දෙකකින් ක්‍රියාත්මක විය. 1997 ජනවාරි පළමු වැනිද සිට ක්‍රියාත්මක වූ පළමු අදියර යටතේ මසකට රු.325/- ක අවමයකට යටත්ව නිර්දේශිත වැඩිවීමෙන් සියයට 40 ක් ප්‍රදානය කරන ලදී. සංශෝධිත වැටුප් පරිමාණයට අනුව වාර්ෂික ඒකාබද්ධ වැටුප රු.90,000/- නොඉක්මවන සියළුම සේවා නියුක්තයන්ට 1998 ජනවාරි පළමුවැනිද සිට සංශෝධනයේ දෙවන අදියර යටතේ නිර්දේශිත වැඩිවීමේ ශේෂය ප්‍රදානය කරන ලදී. පසුව සඳහන් කාණ්ඩය සඳහා වැටුප් සංශෝධනයේ දෙවන අදියර 1998 ජූලි පළමුවනද සිට ක්‍රියාත්මක විය.

මෙම වැටුප් වැඩිවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් මූල්‍ය වැටුප් පරිමාණ දර්ශකයෙන් මනින ලද රාජ්‍ය අංශයේ වැටුප් 1998 දී සියයට 10.5 කින් වැඩි වූ අතර, 1997 දී එම වැඩිවීම සියයට 10.8 කි. වර්ෂය තුළ පාරිභෝගික මිල උද්ධමනය (කො.පා.මි.ද.යට අනුව) වූ සියයට 9.4 ට අනුව, මූර්ත වැටුප් සියයට 0.9 ක සුළු වර්ධනයක් පෙන්නුම් කරන අතර, ඉකුත් වසරේ මූර්ත වැටුප් සියයට 1.0 කින් වර්ධනය වී තිබුණි. මූර්ත වැටුප් සියයට 3.9 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් විධායක නොවන කාණ්ඩයේ වැටුප් සියයට 13.8 කින් සැලකියයුතු ලෙස වැඩිවිය. ඉකුත් වසරේ, මූර්ත වැටුප් සියයට 1.5 ක වර්ධනයක් පිළිබිඹු කරමින් මෙම කාණ්ඩය සියයට 11.3 ක මූල්‍ය වැටුප් වැඩිවීමක් ලබා තිබුණි. සියයට 2.7 කින් මූර්ත වැටුප් පිරිහීමක් පෙන්නුම් කරමින්, සුළු සේවක කාණ්ඩයේ වැටුප් සියයට 6.5 ක අඩු වේගයකින් වැඩි විය. ඉකුත් වසරේ, මෙම කාණ්ඩයේ මූල්‍ය වැටුප් සියයට 10.0 කින් වැඩි වුවද, ඔවුන්ගේ මූර්ත වැටුප් වර්ධනය වූයේ සියයට 0.2 කින් පමණි. 1998 දී මූල්‍ය වැටුප් සියයට 3.5 කින් මඳ වශයෙන් වැඩි වූ රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් සියයට 5.5 කින් පිරිහීමට පත් විය.

### සංවිධිත පෞද්ගලික අංශය

සංවිධිත පෞද්ගලික අංශයට ඇතුළත් වැවිලි ක්ෂේත්‍රයේ වැටුප්වල ප්‍රධාන සංශෝධනයක් සිදු විය. මෙම ක්ෂේත්‍රයේ කාර්මික අරගල සමථයකට පත්කිරීම සඳහා වූ සාමූහික ගිවිසුමෙන් ආවරණය වන වැවිලි ක්ෂේත්‍රයේ නියුතු

සේවකයන්ට 1998 ජනවාරි පළමුවැනිදා සිට වැටුප් වැඩි කිරීමක් ප්‍රදානය කරන ලදී. මේ ගිවිසුම යටතේ, වැඩිහිටි සේවකයන්ගේ වැටුප් රු. 83 සිට රු. 95 දක්වා වැඩි විය. මීට අමතරව, තේ වගාවේ නියැලුන සේවකයන්ට දිනකට රු.6 ක දීමනාවක් ගෙවීම ද ඇරඹුණි. කෙසේ වුවද මාස 18 ක් අවසානයේදී හෝ ඊට පෙර තේ මිල ගණන්-වල තියුණු ලෙස පහත වැටීමක් සිදු වූයේ නම් මෙම ගෙවීම සමාලෝචනය කිරීමට යටත් වේ. රබර් මිල (ආර්.එස්.එස්.නො.1) රු.65 ක මට්ටමේ සිට වැඩිවන සෑම රුපියලකටම ශත 30 බැගින් වෙනස්වන පදනමක් මත අතිරේක ගෙවීමක්ද රබර් වගාවේ යෙදෙන සේවකයනට ගෙවයි. කෙසේ වෙතත්, මෙම අමතර ගෙවීම සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභවලට යටත් නොවේ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ප්‍රාදේශීය වතු සමාගම්වල සේවය කරන සේවකයින් මෙම සාමුහික ගිවිසුමෙන් ආවරණය විය.

ඉහත ගිවිසුමෙන් ආවරණය නොවන වතු සේවකයන් අදළ පඩිපාලක සභාවලින් ආවරණය වේ. රුපියල් 83 ට ස්ථාවර කරන ලද මෙම සේව්‍යයන්ගේ අවම දෛනික වැටුප් රුපියල් 95 දක්වා වැඩි කරනු ලැබීය. තේ වගාවේ හා තිමැවුම් අලෙවි අංශයෙහි නියුතු සේවකයන්ගේ වැටුප් 1998 ඔක්තෝබර් මස සිටද, රබර් වගාවේ හා නිමැවුම් අලෙවි අංශයෙහි නියුතු සේව්‍යයන්ගේ වැටුප් 1998 නොවැම්බර් මස සිටද බලපැවැත්වෙන පරිදි එම වැටුප් වැඩි කිරීම් සිදු කරන ලදී. 1998 දී තවත් පඩිපාලක සභා 19 ක ද අවම වැටුප් වැඩි කරන ලදී. ඉන් සහල් කෙටීම, ගිනිකූරු නිෂ්පාදනය, ගොඩනැගිලි ඉදිකිරීම්, සනීපාරක්‍ෂක සේවා, බේකරි, විස්කෝතු සහ රසකැවිලි නිෂ්පාදනය, මේස් භාණ්ඩ නිෂ්පාදනය, හෝටල් සහ ආහාර සැපයීම, සිනමා, අයිස් සහ සිසිල්බීම නිෂ්පාදනය, ඇඟළුම් නිෂ්පාදනය, ටයර් සහ ටියුබ් නිෂ්පාදනය, ඉංජිනේරු, මෝටර් රථ ගමනාගමනය, සාත්තු නිවාස, සිල්ලර සහ තොග වෙළෙඳම, කොහු ගුදිරි සහ කෙදි අපනයනය, පොල් වගාව හා මත්පැන් සහ විනාකිරි නිෂ්පාදනය යන පඩිපාලක සභාවන් ආවරණය විය.

සංවිධිත පෞද්ගලික අංශයේ වැටුප් වෙනස්වීම් පඩිපාලක සභාවන්හි අවම වැටුප් පරිමාණ දර්ශක මගින් මෙහෙයවනු ලැබේ. ඉහත සඳහන් කළ පඩිපාලක සභා රැසක අවම වැටුප් සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1998 දී පඩිපාලක සභාවන්ගෙන් ආවරණය වූ සේවකයන්ගේ අවම මූල්‍ය වැටුප් පරිමාණ දර්ශකය සියයට 12.3 කින් වැඩි විය. මෙම වැඩිවීම 1997 අනුරූපී අගය වන සියයට 5.9 ට වඩා සැලකිය යුතු ඉහළ යාමකි. මේ අනුව ඉකුත් වසරෙදී සියයට 3.4 කින් පිරිහීමකට ලක්වූන මූර්ත වැටුප් 1998 දී සියයට 2.7 ක සමස්ත වැඩිදියුණු වීමක් වාර්තා කර ඇත. වැවිලි අංශයේ සිදු කළ වැටුප් සංශෝධනය හේතුවෙන් සියයට 3.2 ක මූර්ත වැටුප් වර්ධනයක් පිළිබිඹු කරමින් කෘෂිකර්මයෙහි යෙදී සිටින සේවකයන්ගේ මූල්‍ය වැටුප් සියයට 13.0 කින් වර්ධනය විය. සියයට 3.9 ක මූර්ත වැටුප් වර්ධනයක් පෙන්නුම් කරමින් කර්මාන්ත සහ වාණිජ කටයුතුවල යෙදී සිටින සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 13.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. සේවා අංශයේ සේවකයින් ලැබුවේ සියයට 3.9 ක තරමක අඩු මූල්‍ය වැටුප් වැඩිවීමකි. ඒ අනුව ඔවුන්ගේ මූර්ත වැටුප් අඩුවී ඇත.

## අසංවිධිත අංශය

අසංවිධිත අංශයේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල මගින් රැස් කරනු ලැබේ. 1998 වර්ෂය සඳහා වූ තාවකාලික දත්තවලට අනුව, සුළු පරිමාණයෙන් කෙරෙන ඉදිකිරීම් කටයුතුවල නියුතු වඩු කාර්මිකයන්ගේ සහ

**6.8 සංඛ්‍යා සටහන**

**වැටුප් පරිමාණ දර්ශක අංක (1978 දෙසැම්බර් - 100)**

| | මූල්‍ය | | මූර්ත | | 1998 ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1997 | 1998 (අ) | 1997 | 1998(අ) | මූල්‍ය(අ) | මූර්ත(අ) |
| 1. රජයේ සේවකයන් | | | | | | |
| සියළුම රජයේ සේවකයන් | 906.5 | 1001.4 | 104.0 | 104.9 | 10.5 | 0.9 |
| විධායක නොවන | 842.9 | 959.6 | 96.7 | 100.5 | 13.8 | 3.9 |
| සුළු සේවකයන් | 966.7 | 1029.1 | 110.8 | 107.8 | 6.5 | -2.7 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 778.5 | 805.5 | 89.3 | 84.4 | 3.5 | -5.5 |
| 2. පඩි පාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | |
| සියළුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 849.1 | 953.3 | 97.3 | 99.9 | 12.3 | 2.7 |
| කෘෂිකර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 971.8 | 1097.7 | 111.4 | 115.0 | 13.0 | 3.2 |
| කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලුණු කම්කරුවන් | 710.8 | 807.7 | 81.4 | 84.6 | 13.6 | 3.9 |
| සේවා අංශයන්හි කම්කරුවන් | 487.2 | 506.4 | 55.9 | 53.0 | 3.9 | -5.2 |

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

මේසන්වරුන්ගේ දෛනික වැටුප් පිළිවෙලින් සියයට 7 කින් හා සියයට 8 කින් ඉහළ නැගුණි. වඩු වැඩ සහ මේසන් වැඩ සඳහා වූ පුහුණු අත් උදව්කරුවන්ගේ දිනක වැටුප් පිළිවෙලින් සියයට 9 කින් හා සියයට 7 කින් වැඩි විය. මේ අතර, ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල නියුතු නුපුහුණු අත් උදව්කරුවන්ගේ වැටුප් සියයට 7 - 8 අතර ප්‍රමාණයකින් වැඩි විය. වී වගාවේ ප්‍රධාන කාර්යයන්හි වැටුප් වැඩිවීම සියයට 9-15 ත් අතර පරාසයක පැවතුණි. සී සෑම, වැපිරීම, කෘමිනාශක යෙදීම, වල්පැල නෙලීම, අස්වනු නෙලීම සහ ගොයම් පෑගීම යන කාර්යයන්හි යෙදුන කම්කරුවන්ගේ මූර්ත වැටුප් වර්ධනය වී ඇති බව වාර්තා වේ. තේ වගාවේ අවම වැටුප් අනුපාතයෙහි වැඩිවීම සහ ඉහල යන සුළු තේ මිල ගණන් යන කරුණු දෙකෙහිම බලපෑම පිළිබිඹු කරමින් සුළු පරිමාණයෙන් කෙරෙන තේ වගාවේ ප්‍රධාන කාර්යයන් සඳහා වූ වැටුප් සැලකිය යුතු ලෙස වර්ධනය විය. බිම් සකස් කිරීම සහ දළු නෙලීම සඳහා දිනක වැටුප් පිළිවෙලින් සියයට 10 හා සියයට 12 කින් වැඩි විය. මීට ප්‍රතිවිරුද්ධව, රබර් මිල පහත වැටීම පෙන්නුම් කරමින්, කුඩා රබර් වතුවල කිරි කැපීම සඳහා වූ මූල්‍ය වැටුප් සුළු වශයෙන් අඩු විය. (සමහර අවස්ථාවලදී, කිරි කැපීම සඳහා වූ දීමනාව කපන ලද රබර් කිරිවල වටිනාකම සමග බැඳී පවතී.) පොල් මිල වැඩිවීමට අනුරූපව පොල් වගාවට අයත් කාර්යයන්හි වැටුප් සැලකිය යුතු ලෙස වර්ධනය විය. පොල් වලවල් කැපීම සඳහා වැටුප් සියයට 12 කින් වැඩි වූ අතර, ගෙඩි කැඩීමේ (කෙක්කෙන්) වැටුප් ඉහළ යාම සියයට 20 ට වඩා වැඩිවිය. මේ අනුව, පොල් වගාවෙහි මෙම කාර්යයන්හි නියුතු කම්කරුවන් සඳහා වූ මූර්ත වැටුප් සැලකිය යුතු ලෙස වැඩි විය.